# අධ්‍යාපන අමාත්‍යාංශය

# කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුව

## සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීම - 2025

**01.** කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලයට 2025 වසර සඳහා සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීම වෙනුවෙන් කැමැත්තක් දක්වන සුදුසුකම්ලත් සැපයුම් කරුවන්ගෙන් ඉල්ලුම්පත් කැඳවනු ලැබේ.

**02.** ඒ අනුව, පහත දැක්වෙන ආදර්ශ අයදුම්පත්‍රයට අනුව A4 ප්‍රමාණයේ කඩදාසියක, ඔබ විසින් සකස් කර සම්පූර්ණ කරන ලද අයදුම් පත්‍රය, අධ්‍යක්ෂ ජනරාල්, කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපර්තමේන්තුව,අංක 557,ඕල්කොට් මාවත, කොළඹ 10. ලිපිනයට, තම ව්‍යාපාරය ලියාපදිංචි කිරීමේ සහතිකයේ සහතික කළ පිටපතක් සමඟ 2024.12.09 දින ප.ව 3.00 ට පෙර අතින් ගෙනවිත් භාරදීම හෝ ලියාපදිංචි තැපෑලෙන් ලැබීමට සැලැස්විය යුතු ය. එක් එක් කාණ්ඩ යටතේ වන අයිතම සඳහා පළමු අයදුම් පත්‍රයට රු.5000/- බැගින් ද වැඩිවෙන අනෙක් අයදුම් පත්‍ර සඳහා රු.2500/- බැගින් ද වෙන  වෙනම අයදුම්පත්‍ර සමඟ ( එක් එක් භාණ්ඩය සඳහා ) මහජන බැංකුවේ නගර මධ්‍ය ශාඛාවේ ගිණුම් අංක 176-1001-3-9026228 දරණ " අධ්‍යක්ෂ ජනරාල් කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපර්තමේන්තුව" නමින් ගෙවා , රිසිට්පතේ පිටපත් එක් එක් අයදුම්පතට ඇමිණිය යුතු අතර මුල් රිසිට් පත අනිවාර්යයෙන්ම වෙනම ඉදිරිපත්කළ යුතුය.

**1.ශිෂ්‍ය පුහුණු උපකරණ**

i. ශිෂ්‍ය ඉගෙනුම් හා ඉගැන්වීම් උපකරණ (වයිට් බෝඩ්, ග්‍රීන් බෝඩ්, බහු මාධ්‍ය ප්‍රක්ෂේපණ යන්ත්‍ර ආදිය Interactive Smart Board, සියලුම ආකාරයේ ශ්‍රව්‍ය දෘෂ්‍ය උපකරණ)
ii. විදුලි හා විද්‍යුත් උපකරණ (ශිෂ්‍ය පුහුණු උපකරණ)
iii.වැඩහල් යන්ත්‍ර සූත්‍ර, ආවුධ සහ ආරක්ෂණ උපකරණ ක්ෂේත්‍රයට (ශිෂ්‍ය පුහුණු උපකරණ)
iv.**කෘෂිකර්ම** පාඨමාලා සඳහා යන්ත්‍රෝපකරණ සහ ද්‍රව්‍යය
v.මෝටර් වාහන, මොටර් සයිකල් හා ත්‍රිරෝද රථ ක්ෂේත්‍රය සඳහා අවශ්‍ය වන පුහුණු උපකරණ
vi.බිම් මැනීම සඳහා භාවිතා කරණ මිණුම් උපකරණ
vii.ගොඩනැගිලි ඉදිකිරීම් ශිල්පයට අදාල පුහුණු උපකරණ
viii.වායු සමන ශීතකරණ ක්ෂේත්‍රයට අදාල පුහුණු උපකරණ
ix.පෑස්සුම් ශිල්පයට අදාල පුහුණු උපකරණ
x.වෑද්දුම් ශිල්පයට අදාල පුහුණු උපකරණ
xi.යන්ත්‍ර ශිල්පයට අදාල පුහුණු උපකරණ
xii.ජලනල ක්ෂේත්‍රයට අදාල පුහුණු උපකරණ
xiii.විදුලි /විද්‍යුත්/විදුලි සංදේශ ක්ෂේත්‍රයට අදාල පුහුණු උපකරණ
xiv.නිෂ්පාදන තාක්ෂණයට අදාල පුහුණු උපකරණ
xv.ඇඳුම් මැසීමේ කර්මාන්තයට අදාල පුහුණු උපකරණ
xvi.පාවහන් නිෂ්පාදනයට අදාල පුහුණු උපකරණ
xvii.ආහාර තාක්ෂණය හා සුපවේදී අංශය සඳහා අදාල පුහුණු උපකරණ
xviii.ශීතාගාර සඳහා අවශ්‍ය පුහුණු උපකරණ

**2. කාර්යාලීය ලිපි ද්‍රව්‍ය**

i.රබර් සීල්, දින මුද්‍රා ආදී මුද්‍රා වර්ග
ii.කාර්යාලීය ලිපි ද්‍රව්‍ය
iii.කාර්යාල බෑග් විශේෂ

**3. යන්ත්‍රෝපකරණ**

i.පරිගණක, මුද්‍රණ යන්ත්‍ර, ෆැක්ස් යන්ත්‍ර, ස්කෑන් යන්ත්‍ර සහ ඇඟිලි සලකුණු යන්ත්‍ර ආදිය
ii පරිගණක, මුද්‍රණ යන්ත්‍ර, ඡායා පිටපත් යන්ත්‍ර, ෆැක්ස් යන්ත්‍ර, ස්කෑන් යන්ත්‍ර, CCTV කැමරා පද්ධති සහ ඇඟිලි සලකුණු යන්ත්‍ර අලුත්වැඩියා / සේවා සිදු කිරීම හා ඊට අදාල අමතර කොටස් සැපයීම.
iii.පරිගණක ජාල පද්ධති.
iv. යන්ත්‍රෝපකරණ අලුත්වැඩියාව විදුලි/විද්‍යුත්/යාන්ත්‍රික අලුත්වැඩියා වැඩහල් උපකරණ සහ යන්ත්‍ර සූත්‍ර
v.ආරක්ෂණ උපකරණ ගිනි නිවීමේ ආරක්ෂණ උපකරණ හා උපාංග සැපයීම හා සවි කිරීම හා සේවා කිරීම
vi. විදුලි උපාංග සැපයීම
vii විදුලි/විද්‍යුත්/යන්ත්‍රික අමතර කොටස් සැපයීම (විදුලි උපාංග සැපයීම වෙනුවට)- (Lethe ,Milling, CNC Machine, Welding, Automobile Simulators, ,Electrical PLC, Hydraulic, Pneumatic, Electrical Switch Gears, Pulleys, Nut, Bolts, Belts, Bearings and various training equipment's spars etc.)

**4. වාහන නඩත්තු සේවා**

i.කාර්යාලීය උපකරණ අලුත්වැඩියාව
ii.විශේෂ වාහන නවීකරණ ක්‍රියාවලින් (ආසන ආවරණ, වෙනස් කල හැකි ආසන, ආසන කුෂන් කිරීම, වීදුරු ටින්ටඩ්, කාපට් ආදිය)
iii.වාහන අලුත්වැඩියාව/සේවාවන්/අභ්‍යන්තර පිරිසිදු කිරීම් ආදිය
iv.වාහන සඳහා පාරිභෝජ්‍ය ද්‍රව්‍ය (ටයර්, බැටරි ආදිය)
v.වායු සමන යන්ත්‍ර අලුත්වැඩියාව සහ නඩත්තු කිරීම
vi.වැඩහල් යන්ත්‍ර සහ උපකරණ අලුත්වැඩියාව/සේවාවන් සමග කිරීම

**5. ගොඩනැගිලි ඉදිකිරීම් ක්ෂේත්‍රය, ගොඩනැගිලි ඉදිකිරීම්,අලුත්වැඩියා හා යටිතල පහසුකම් සංවර්ධනය කිරීම**

i.ගොඩනැගිලි නඩත්තු සේවාවන් හා ගොඩනැගිලි ඉදිකිරීම්, භූගත නල අපවහන පද්ධති නඩත්තු කිරීම, ගොඩනැගිලි ඉදිකිරීම් උපාංග හා යන්ත්‍රසූත්‍ර කුලියට ලබාගැනීම, ජල ආරක්ෂණප්‍රතිකාර සේවා.
ii.ගෙවතු අලංකරණය
iii. ගොඩනැගිලි අභ්‍යන්තර හා පිටත අලංකරණය
iv. ගොඩනැගිලි අලුත්වැඩියා කිරීම
v. ගොඩනැගිලි වැඩහල් හා විද්‍යාගාර විදුලි තැතදීම්
vi.ජල පොම්ප සැපයීම අලුත්වැඩියාව සහ සවි කිරීම
vii. ගොඩනැගිලි ඉදිකිරීම ද්‍රව්‍ය සැපයීම (දෙපාර්තමේන්තු සහ දිවයින පුරා විසිරී ඇති තාක්ෂණ/කාර්මික විද්‍යාල සඳහා)
viii. ගොඩනැගිලි සඳහා වායු සමන යන්ත්‍ර සැපයීම සහ සවි කිරීම
ix. ගොඩනැගිලි සඳහා වායු සමන යන්ත්‍ර අලුත්වැඩියාව සහ සේවා කිරීම
x.ඇලුමීනියම් වෙන් කිරීම සහ දොර ජනෙල් සපයා සවි කිරීම
xi. ගොඩනැගිලි ගිනි නිවීමේ උපකරණ නැවත පිරවීම සහ සේවා කිරීම
xii. ගොඩනැගිලි ජනේල හා දොරවල් සඳහා තිර රෙදි දැමීම
xiii.ලී පුටු හා මේස අලුත්වැඩියා කිරීම
xiv.වානේ අල්මාරි හා කබඩ් අලුත්වැඩියා කිරීම
xv.යකඩ රාමු හා ඇලුමීනියම් පියන් සහිත කබඩ් සැකසීම

**6. වෙනත් සේවා**

i.ආහාරපාන ආදිය සැපයීම Mini food city with cafeteria
ii.පරිගනක ජාලගත කිරීම සහ විදුලා සංදේශ පද්ධති අලුත්වැඩියා ආශ්‍රිත සේවාවන්
iii.සිවිල් ඉංජිනේරු උපදේශක සේවා
iv.විදුලි හා යාන්ත්‍රික වරලත් ඉංජිනේරු සේවා
v.නාම පුවරු සකසා සැපයීම සහ සවි කිරීම
vi.සියලුම ආකාරයේ මුද්‍රණ කටයුතු (පොත් පත් පොස්ටර් ආරාධනා පත්‍ර සහතික හා සියලුම ඩිජිටල් මුද්‍රණ කටයුතු හා ප්ලාස්ටික් අකුරු යනාදිය)
vii.ඡායාරූප මුද්‍රණය කිරීම කාර්යාලීය හැඳුණුම්පත් සකස් කිරීම
viii.සියලුම වර්ගයේ කාර්යාලීය උපකරණ අලුත්වැඩියා කිරීම (ගෘහ භාණ්ඩ, වායු සමීකරණ යන්ත්‍ර, ශීතකරණ, විදුලි පංකා, විදුලි කේතල, රූපවාහිණී යන්ත්‍ර ඇතුලු සියලුම වර්ගයේ විදුලි උපකරණ යනාදිය ඇතුලුව)
ix.උත්සව සඳහා ආහාර පාන සැපයීම
x.කෘමීන් මර්ධන කටයුතු

**කොන්දේසි**

එසේ ඔබ විසින් සම්පූර්ණ කරන ලද ඉල්ලුම් පත්‍රය බහාලන ලියුම් කවරයේ වම්පස ඉහල කෙලවරේ "**සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීම - 2025**"යනුවෙන් සඳහන් කල යුතු අතර ඉහත සඳහන් උපදෙස් වලට හා කොන්දේසි වලට පරිබාහිරව යොමු කරන ඉල්ලුම් පත්‍ර ප්‍රතික්ෂේප කරනු ලැබේ.

1. ඉදිකිරීම් කොන්ත්‍රාත් කරුවන් එයට අමතරව CIDA ආයතනයේ ලියා පදිංචි වී සහතිකයේ පිටපතක්ද ඉදිරිපත් කල යුතුය.  ගෘහ නිර්මාණ ශිල්පීන් ශ්‍රී ලංකා වරලත් වාස්තු විද්‍යා ආයතනයේ සාමාජිකත්වය ලබා තිබිය යුතුය. (AIA/FIA) තවද ගෘහ නිර්මාණ ශිල්පීන් වාස්තු විද්‍යාර්ථයින්ගේ ලියා පදිංචි කිරීමේ මණ්ඩලයේ (Architecture Registration Board) ලියා පදිංචි වී සිටිය යුතුය.
2. සියලුම සැපයුම් කරුවන් දෙපාර්තමේන්තුවේ ඇණවුම් සැපයිය හැකි ප්‍රමාණයේ තොග පවත්වාගෙන යායුතු වේ.
3. සැපයුම් කරුවන් මෙම දෙපාර්තමේන්තුවේ මිලදී ගැනීමේ නියෝගයේ සඳහන් දිනට ප්‍රථම ඇනවුම් සම්පූර්ණ කල යුතුය. වාර දෙකකදී එලෙස ඇණවුම් සැපයීමට අපොහොසත් වන සැපයුම් කරුවන් දෙපාර්තමේන්තුව විසින් අසාධු ලේඛනයට (Black List) ඇතුලත් කරනු ලැබේ.
4. සැපයුම් කරුවන් විදේශ වලින් ගෙන්වන උපකරණ සඳහා ලංකාවේ බලයලත් නියෝජිතයෙකු නම් ඒ බව තම අයදුම්පත්‍රයේ සඳහන් කල යුතුය.
5. අලවියෙන් පසු සේවා කටයුතු ද නියමිත පරිදි ඉටුකල යුතු වේ.
6. මේ පිළිබඳ වැඩිදුර තොරතුරු මෙම දෙපාර්තමේන්තුවේ තාක්ෂණික සහාය සේවා අංශයේ දුරකථන අංක 011-2327008 මඟින් ලබාගත හැක. Website-www.dtet.gov.lk
7. ලියාපදිංචි නොවූ සැපයුම්කරුවන්ගෙන්ද ඊට අමතරව ශ්‍රී ලංකා දුරකථන නාමාවලියේ රේන්බෝ පේජස්හි සඳහන් සැපයුම්කරුවන්ගෙන්ද ලංසු කැඳවීමේ අයිතිය දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් හා ප්‍රසම්පාදන කමිටුව සතුය.
8. නියමිත අවස්ථා වලදී මිල ගනන් ඉදිරිපත් නොකරන හෝ නියමිත වෙලාවට භාණ්ඩ නොසපයන හෝ මිල ගනන් ඉදිරිපත් කිරීමේදී කොන්දේසි නොපිලිපදින සැපයුම්කරුවන්ගේ ලියා පදිංචිය කිසිදු දැනුම්දීමකින් තොරව අවලංගු කරනු ලැබේ.